2.1 අල් ඉබාදත්

"අබ්දු" නම් මූලයෙන් උත්පත්තිය වූ "ඉබාදත්" නම් අරාබි පදය යටහත් වීම, නැමදීම සහ අවනත වීම යන තේරුම දෙයි. අල්ලාහ්ට මුළුමනින්ම යටහත් වී ඔහු නැමද ඔහුට පමණක් වහල් වීම මෙයින් හැඟවෙයි.

අල්ලාහ් තම ස්වාමියා ලෙස පිළිගෙන ඔහුට කෘතඥතාව දැක්වීම ද ඔහුගේ අණට කීකරු වීම ද ඔහුට ආචාරශීලි වීම හා ප්‍රණාම දැක්වීම ද ඉබාදත් නම් වචනයෙන් ගම්‍ය වෙයි.

" (මා හට අවනත වී) මා නැමදීමට හැර මනුෂ්‍ය වර්ගයා සහ ජින් වර්ගයා මා මවා නැත" (51:56) යනුවෙන් අල්ලාහ් අල්කුර්ආනයේ පවසයි. මිනිසා මවන ලද්දේ අල්ලාහ්ට ඉබාදත් කිරීමට බව මෙම වාක්‍යය පැහැදිළිව ගෙන හැර දක්වයි. මේ අනුව නැමදුම් හා වතාවත් වශයෙන් අල්ලාහ් ද ඔහුගේ අණ පරිදි ඔහුගේ රසූල්වරයා ද නිර්ණය කර දුන් ඒවා පමණක් නොව මුස්ලිම්වරයෙකුගේ එදිනෙදා ලෞකික ක්‍රියාකාරකම් ද ඉබාදත් වශයෙන් සළකනු ලබන බව මෙයින් අදහස් කෙරේ.

අල්ලාහ් ද ඔහුගේ අණ පරිදි ඔහුගේ රසූල්වරයා ද නිර්ණය කර දී ඇති නැමදුම් සහ වතාවත් වලට සලාත්, සව්ම්, සකාත්, හජ් යනාදිය උදාහරණ වශයෙන් සඳහන් කළ හැකිය.

එදිනෙදා ලෞකික ක්‍රියාකාරකම් වන ආහාර අනුභව කිරීම, ඇදුම් ඇඳීම, ඉපයීම යනාදිය ඉබාදත් හි අඩංගු වේ. නමුත් මෙම ක්‍රියාකාරකම් ඉබාදත් ලෙස අනුමත වීමට නම් ඒවා සමහර සුවිශේෂි ලක්ෂණ වලින් සමන්විත විය යුතු බව ඉස්ලාමීය විද්වතුන්ගේ මතය වෙයි. ඒවා පහත සඳහන් ආකාරයට සංක්ෂිප්තව ලැයිස්තු ගත කළ හැකිය.

(අ) පිවිතුරු චේතනාව :

මූලික නැමදුම් පිළිගැනීමට නියියත් මූලික වන්නාක් මෙන් එදිනෙදා ලෞකික ක්‍රියාකාරකම් සඳහා පිවිතුරු චේතනාව මූලික වෙයි. එනම් අල්ලාහ් වෙනුවෙන් යන චේතනාව සමග අල්ලාහ් විසින් නිර්ණය කරන ලද සීමාවන් උල්ලංඝනය නොවන ආකාරයට එදිනෙදා ක්‍රියාකාරකමක් ඉටු කිරීමෙන් එම ලෞකික ක්‍රියාකාරකම ඉබාදත් බවට පත්වේ. හලාල් වන ආහාර පමණක් අනුභව කිරීම, අල්ලාහ් සහ රසූල්වරයා නිර්ණය කළ පරිදි ඇඳුම් ඇඳීම, අල්ලාහ් අනුමත කළ ක්‍රමවලින් ඉපයීම මෙයට නිදසුන් කිහිපයකි.

(ආ) ඉස්ලාමයේ අනුමැතිය තිබීම :

කිසියම් එදිනෙදා ක්‍රියාකාරකමක් වුව ද එයට ඉස්ලාමයේ අනුමැතිය තිබිය යුතුයි. එය ඉබාදත් වශයෙන් පත්වන්නේ එවිටය. ඉස්ලාම් අනුමත නොකළ කිසියම් ක්‍රියාකාරකමක් ඉබාදත් නොවනු ඇත. උදාහරණ:- වෙළෙඳාම ඉස්ලාම් අනුමත කර ඇති අතර පොළිය ඉස්ලාම් අනුමත කර නොමැත.

(ඇ) ෂරීආවේ සීමාවන් කඩ නොකිරීම :

කිසියම් එදිනෙදා ක්‍රියාකාරකමක් ෂරීආවේ සීමාවන් කඩ නොකරන තෙක් එය ඉබාදත් වශයෙන් සලකනු ඇත. ෂරීආවේ නිර්ණය කර ඇති ක්‍රියා පිළිවෙළෙට අනුව යම් ක්‍රියාවක් කරන විට එය ඉබාදතයේ තැනක් ගනියි. උදාහරණ :- වෙළෙඳ භාණ්ඩ වලට බාල ද්‍රව්‍ය කලවම් කිරීම, වැඩි මිලට විකිණීම සඳහා සඟවා තැබීම සහ කිරුම් මිනුම්වල වංචාවන් සිදුකිරීම යනාදිය වළක්වා ඉස්ලාම් විසින් පනවා ඇති නිර්ණායක අනුගමනය කර වෙළෙඳාම් කිරීම.

(ඈ) පිළියෙළ:
කිසියම් ක්‍රියාකාරකමක් වුව ද එහි පිළිවෙලක් තිබිය යුතුය. නාස්තිය, දූෂණය සහ වංචාව එම ක්‍රියාකාරකම සමග මුසු නොවීමට වග බලාගත යුතුයි. එම ක්‍රියාකරකම ඉබාදත් බවට පත්වෙන්නේ එවිටය.

(ඉ) මූලික වතාවත්වලට අවහිර නොවීම:
එදිනෙදා ලෞකික ක්‍රියාකාරකම සලාත් සව්ම් වැනි මූලික ඉබාදත්වලට අවහිර නොවී පැවතීම එය ඉබාදත් වශයෙන් සැළකීමට ඇති තවත් සුවිශේෂ ලක්ෂණයකි. සිකුරාදා ජුම්ආ සලාතයට කැඳවනු ලැබීමෙන් අනතුරුව වෙළෙඳාමෙහි නියැලී සිටින විට එම වෙළෙඳාම ඉබාදත් වශයෙන් නොසැළකේ.

ඉබාදත් වර්ග

සාමාන්‍යයෙන් ඉබාදත් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කෙරේ. ඒවා ෆර්ල් හා සුන්නත් වෙයි. ෆර්ල් යනු අනිවාර්යයෙන් ඉටු කළ යුතු ඒවා වෙයි. සුන්නත් යනු අතිරේකව ඉටු කළ යුතු වෛකල්පිත ඒවා වෙයි.

ෆර්ල් වන ඉබාදත් ෆර්ල් අයින් සහ ෆර්ල් කිෆායා වශයෙන් දෙවර්ගයකි.

ෆර්ල් අයින් :

සෑම පුද්ගලයෙකුම අනිවාර්යයෙන් ඉටුකළ යුතු වගකීම් මෙහි අඩංගු වෙයි. ෂරීආවේ පිලිගත් හේතුවලින් තොර වූ වෙනත් හේතූන් වෙනුවෙන් මෙම වගකීම ඉටු නොකරන්නා දඬුවමට ලක් විය යුතු වරදකරුවෙක් වෙයි. පංච කාල සලාත් සහ රමළාන් මාසයේ සව්ම් සමාදන් වීම වැනි මූලික වතාවන් ද දෙමවුපියන්ට කීකරු වීම සහ නඩත්තු කිරීම වැනි එදිනෙදා ක්‍රියාකාරකම් ද මෙම වර්ගයට නිදසුන් කිහිපයකි.

ෆර්ල් කිෆායා :

සෑම පුද්ගලයෙකුගේම වගකීමක් වුව ද කවරෙකු හෝ මෙය ඉටු කෙළේ නම් ඔහුට ආනිසංස ලැබෙන අතර සෙසු අය එම වගකීමෙන් නිදහස් වෙති. කිසිවෙක් එය ඉටු නොකළේ නම් එම සමාජයේ සියළු දෙනාම වරදකරුවන් වෙති. බොහෝ විට සමාජ සුබසාධන ක්‍රියාකාරකම් මෙයට අයත් වෙයි. උදාහරණ : ජනාසාවට අදාල යුතුකම් ඉටුකිරීම, ආගමික කටයුතුවල නිපුණයින් (ආලිම් හා හාෆිළ්) බිහි කිරීම සහ සමාජයට ප්‍රයෝජනවත් දැනුම (ගුරුවරයා) හෝ ක්ෂේත්‍ර (වෛද්‍යවරයා) හා සම්බන්ධ විද්වතුන් බිහි කිරීම.

සුන්නත් :

මෙය ෆර්ල් වන ඉබාදත් සේ අනිවාර්ය නොවන නමුත්, මේවා ඉටුකිරීමෙන් අල්ලාහ්ගේ දයාව සහ අපරිමිත ආනිසංස ලබාගත හැකිය. ෆර්ල් වන සලාත්වල වැදගත්කම ගෙන හැර දක්වන්නකි. සුන්නත් සලාත්, සුන්නත් සව්ම් වැනි මූලික වතාවත් සමග රෝගීන් බැහැ දැකීමට ගොස් ඔහුගේ සුවය පතා ප්‍රාර්ථනා කිරීම, ආහාර අනුභව කිරීමට පටන් ගැන්මේ දී බිස්මිල්ලාහ් කීම සහ වැඩිහිටියන්ට ගරුකිරීම වැනි එදිනෙදා ක්‍රියාකාරකම් මෙම වර්ගයට නිදසුන් කිහියකි.

සාමාන්‍යයෙන් මිනිස් ජීවිතය සමග ඉබාදත් ඉතා සමීප සම්බන්ධයක් පවත්වයි. දේව විශ්වාසය සහ දික්ර් යනාදිය සිත සමග සම්බන්ධවෙයි. සලාත්, සව්ම් යනාදිය වතාවත් සිත සහ කය සමග සම්බන්ධ වෙයි. සකාත්, අකීකා යනාදිය සිත සහ ද්‍රව්‍ය සමග සම්බන්ධ වෙයි. හජ්, ජිහාද් යනාදිය සිත, කය, ද්‍රව්‍ය සමග සම්බන්ධ වෙයි. මෙසේ ඉබාදත් සිත, කය, ද්‍රව්‍ය සමග සම්බන්ධ වී ඇති බව පෙනේ.

ඉබාදත් වල බාහිර ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට ෂර්ත්, ෆර්ල්, සුන්නත් යනාදිය සමග මුබ්තිලාත්ද දක්නට ඇත. එසේම ඉබාදත් වල නිසි ප්‍රයෝජන අත්කර ගැනීමට චිත්ත පාරිශුද්ධියත් අත්‍යවශ්‍යය කරුණකි. එම නිසා ඉබාදත්වල නියලෙන්නෙකු සතුව “ඉඛ්ලාස් ” නම් නොකෙළෙස් සිතුවිලි “වරඋ” නම් රැකිම “ තක්වා” නම් භිය භක්තිය, “ කුෂූඋ” “කුලූඋ” නම් සිත්බිය යනාදිය ලක්‍ෂණ ඇත්නම් ඔහුගේ ඉබාදත් හොඳ ප්‍රයොජනයක් අත්කර දෙයි.

ඉබාදත්හි අරමුණ තොරුම් ගෙන චිත්ත පාරිශුද්ධිය සමග එය ඉටු කිරිමේදි මිනිස් හැසිරීමේ විවිධ නිරෝගි වෙනස්කම් ඇතිවන බව අල්කුර්ආනය සහ සුන්නාහ්ව පවසා සිටියි. නින්දිත ක්‍රියා සහ පිළිකුල් සහගත දේ සලාතය විසින් තුරන් කරනු ලබයි. නරක වදන් සහ පහත් හැසිරීම් වලින් සව්ම් ආරක්‍ෂා කරයි. වස්තුවද සිතද සකාත් පිරිසිදු කරයි. අනවශ්‍ය තර්ක සහ කුහකකමින් හජ් මිනිසා ආරක්‍ෂා කරයි.

එබැවින් ඉබාදත්වල මූලික අරමුණු අවබෝධ කරගෙන චිත්ත පාරිශුද්ධිය ඇතිව ඉබාදත් ඉටුකර එහි ප්‍රයෝජනය මෙලොවේදි සහ පරලොවේදි අත්කර ගැනීමට උත්සහ කරමු.

අභ්‍යාසය

ෆර්ල් අයින්, ෆර්ල් කිෆායා සහ සුන්නත් යනාදී වර්ග වලට උදහරණ පහක් බැගින් තෝරා ඒවා සුදුසු වගුවකින් ඉදිරිපත් කරන්න.

2.2 අත්තහාරත් I

2.2.1 ජලවර්ග

ඉස්ලාම් පිරිසිදුකමට ප්‍රමුඛ ස්ථානයක් දෙන ජීවන ක්‍රමයකි. මුස්ලිම්වරයෙකුගේ එදිනෙදා ජීවිතයේ උදෑසන අවදිවීමේ සිට රාත්‍රී නිදා ගැනීමට යන තෙක් ඔහු විසින් ඉටු කරනු ලබන ආහාර පාන ගැනීම, මල මූත්‍ර පහකිරීම, නෑම වැනි විවිධ ක්‍රියාකාරකම් වලදී ද තමන් පිරිසිදු කරගැනීම පිළිබඳ සමහර ක්‍රම විධි ඉස්ලාම් විසින් සකස් කර ඇත. අභ්‍යන්තර සහ බාහිර පිරිසිදුකම රැකගැනීමේ අවශ්‍යතාව ගැනත් කිල්ල ගැනත් කළින් ඔබ ඉගෙන ගෙන ඇත. මෙම පාඩමේදී පිරිසිදු කිරීමට ඉවහල් වන ජලයේ වර්ග ගැන දැනගෙන එය ප්‍රයෝජනවත් කර ගනිමු.

මිනිස් ජීවිතයේ සෑම කටයුත්තතදීම ඉස්ලාම් පිරිසිදුකම අවධාරණය කරයි. එතාවත් වුව ද එදිනෙදා මිනිස් ක්‍රියාකරකම් වුව ද පිරිසිදුකම පදනම් කොට ගෙන එය සිදුවිය යුතු යැයි ඉස්ලාම් අපේක්ෂා කරයි. මෙනිසාම සූරා තෞබා 108 වෙනි වාක්‍යයේ අවසාන කොටසෙහි. අල්ලාහ් පිරිසිදුව සිටින්නන් ප්‍රිය කරන බව අල්කුර්ආනය පවසයි. තවද නබි (සල්) තුමාගේ හදීස් වලින් එකක් "ඉස්ලාම් පිවිතුරු වුවකි: එමනිසා ඔබත් පිවිතුරු බව පුරුද්දක් කර ගන්න" යනුවෙන් පවසයි. මෙසේ බලනවිට පිරිසිදුකම සුරැකිම ඉබාදත් යන තත්ත්වයේ පවතින බව දැක ගත හැකිය.

ජලය බාහිර පිරිසිදුකමට ඉවහල් වන දෙයකි. එහි ස්වභාවය මත ජලය ඉස්ලාමීය නීති විද්වතුන් විසින් තෙවර්ගයකට බෙදා ඇත.



I අල්මාඋත් තහුර්

මෙය ඉතා පිරිසිදු ජලයයි. තම ස්වභාවික ගුණයෙන් කිසිම වෙනසක් නොවූ ජලය මෙම වර්ගයට අයත් වෙයි. මෙය ජලය ස්වාභාවයෙන්ම පිරිසිදු වන අතර අනෙකුත් ඒවා පිරිසිදු කිරීමේ හැකියාවද මෙම ජලයට ඇත. උල්පත් ජලය, ගංගා ජලය, මුහුදු ජලය සහ වැසි ජලය යනාදිය මෙයට උදාහරණ වේ. මුහුදු ජලයේ ලවණ ගතිය එහි ස්වාභාවික ගුණයයි. එසේම පසේ ස්වභාවය සමග මුසුවී ඇති ජලයද මෙම වර්ගයටම අයත් වේ. ගෙන්දගම් මිශ්‍ර පසේ දක්නට ඇති ජලය, මඩ සහිත පසේ රැඳී තිබෙන ජලය, පාසි සහිත ජලය යනාදිය මෙයට උදාහරණ වේ.

වුළු කිරීම, නෑම, අපද්‍රව්‍ය ඉවත් කිරීම වැනි ආගමික කටයුතුවලට ද එදිනෙදා ක්‍රියාකාරකම්වලට ද මෙම වර්ගයේ ජලය උපයෝගි කරගත යුතුයි.

ඉතා පිරිසිදු ජලය, එහි ප්‍රමාණය අනුව මාඋන් මුත්ලක් සහ මාඋන් කලිල් යනුවෙන් වර්ග දෙකකට බෙ-දේ. කාන්තාර භූමියේ තිබූ ජලය සතුන් පානය කිරීම පිළිබඳව නබි (සල්) තුමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයකට එතුමන් විසින් "ජලය කුල්ලතෛන් (කුල්ලත් දෙකක්) ප්‍රමාණයට පත් වූ විට එය නජීස් බවට පත්නොවේ" යනුවෙන් පිළිතුරු දුන් හදීසය ඉහත වර්ගයට උදාහරණ වේ.

මා උන් මුත්ලක් : මෙය "අධික ජලය" වශයෙන් හැඳින් වේ. මෙය කුල්ලතෛන් (කුල්ලත් දෙකක්) ප්‍රමාණයට වඩා වැඩියෙන් ඇති ජලයයි. කුල්ලතෛන් යනු ලිටර් 210 ට වඩා අධික ජලයයි. මෙම ජලයේ කිසියම් නජිසයක් මිශ්‍ර වී එම ජලයේ සුවඳ, පැහැය හා රස යනාදී කරුණු තුනෙන් යමක වෙනසක් සිදුවේ නම් එය නජිස් බවට පත්වේ. එය වෙනත් කටයුත්තකට උපයෝගී කරගත නොහැකිය. කලකට පසුව හෝ අමතර ජලය එකතුවීමෙන් එම වෙනස ඉවත් වී ජලයේ ස්වාභාවික ගතිය නැවතත් දක්නට ලැබේ නම් එම ජලය නැවතත් අධික ජලය බවට පත්වෙයි. එවිට එය අනිවාර්ය වගකීම් ඉටුකිරීමට උපයෝගී කරගත හැකිය.

මාඋන් කලීල් : මෙය "අල්ප ජලය" වශයෙන් හැඳින්වේ. මෙය කුල්ලතෛන්ට වඩා අඩු ජලයයි. එනම්, ලිටර 210 ට වඩා අඩු ප්‍රමාණයකින් යුත් ජලයයි. මෙම ජලයට යම් නජිසයක් එකතු වූ විට එහි පැහැය, සුවඳ සහ රස යනාදියෙහි වෙනසක් සිදුනොවුවත් එය නජිස් වශයෙන් සැලකේ. එහෙත් රුධිර සංස්කරණයක් නොමැති මැස්සා, කුහුඹුවා සහ හූනා යනාදී පිවිත් මිය ගිය තත්ත්වයක වැටුණ ද මෙම ජලය නජිස් බවට පත් නොවේ.

අල්ප ජලයට ඉතා පිරිසිදු ජලය අමතරව එක්කර එහි සිදුවූ පැහැය, සුවඳ සහ රස යනාදිය වෙනස් වී නැවතත් එම ජලය පෙර පැවැති ස්වභාවයට පැමිණියේ නම් එය අල්මාඋන් තහූර් බවට පත්වන අතර එය භාවිතයට ගැනීමට හැකිවනු ඇත.

තවද, ස්වල්ප ජලය පමණක් රැඳවිය හැකි ධාරිතාව අඩු ප්‍රමාණයේ භාජනයක හෝ රෙදි සෝදන යන්ත්‍රයක නජිස් තැවරුණු රෙදි වර්ග දමන විට හෝ සෝදන විට එම භාජනය ද එහි ඇති ජලය ද සෙසු ඇඳුම් ද නජිස් වන නිසා මුලින්ම එම නජිස් ඉවත්කර ඉන් පසුව ඒවා එම භාජනයට හෝ රෙදි සෝදන යන්ත්‍රයට දැමිය යුතුය.

මාඋන් මුස්තඃමල්

මෙය "පරිහරණය කරන ලද ජලය" යනුවෙන් හැඳින්වේ. එනම් කුල්ලත් දෙකකට අඩු ජලය ෆර්ල් වන නෑමට හෝ වුළූ සඳහා උපයෝගී කර ඇත්නම් එය පරිහරණය කරන ලද ජලය බවට පත්වේ. මෙලෙස ෆර්ල් වූ කටයුත්තක් සඳහා උපයෝගී කළ මෙම ජලය වෙනත් ෆර්ල් වූ කටයුත්තකට උපයෝගී කරගත නොහැකිය. එහෙත් මෙම ජලය සමඟ ඉතා පිරිසිදු ජලය අමතරව එකතු කළ විට එය අධික ජලය (මාඋන් මුත්ලක්) බවට පත් වූ විට පරිහරණය කරන ලද ජලය නම් තත්ත්වයෙන් එය මිදෙන අතර එය ෆර්ල් වූ කටයුත්තකට නැවතත් උපයෝගී කරගත හැකිය.

II අල්-මාඋත් තාහිර්

මෙය "පිරිසිදු ජලය" නමින් හැඳින්වේ. මෙය ජල වර්ග අතර ඉතා පිරිසිදු ජලයට දෙවන තැන ගනී. පිරිසිදු වෙනත් ද්‍රව්‍යයක් මුසුවීම නිසා සිය ස්වාභාවික තත්ත්වයෙන් වෙනස් වූ ජලය මෙම වර්ගයට අයත් වේ. එනම් මෙම ජලයේ ස්වාභාවික තත්ත්වයෙන් පැහැය හෝ සුවඳ හෝ රසය හෝ වෙනස්ව පවතියි. තේ, කෝපි, පිනිදිය, සෝඩා වැනි බීම වර්ගද මෙයට උදහරණ ලෙස ගත හැකිය. කුරුම්බා වතුර ද ජලයේ ස්වාභාවික තත්ත්වයෙන් වෙනස් වූ ස්වාභාවික පළතුරු යුෂද මෙම වර්ගයට අයත් වේ.

තමා පිරිසිදු වුවද වෙනත් කෙනෙක් හෝ දෙයක් පිරිසිදු කිරීමට මෙම ජලය නුසුදුසුය. එම නිසා ෆර්ල් වූ කටයුතු ඉටු කිරීමට හෝ වෙනත් දෙයක් පිරිසිදු කිරීමට හෝ මෙම ජලය භාවිතා කළ නොහැකිය.

III අල්මාඋන් නජිස්

මෙය "අපිරිසිදු ජලයයි." ස්වාභාවිකව නජිස් වන හා නජිස් වූ යම් දෙයක් මිශ්‍රව දක්නට ලැබෙන ජලය මෙම වර්ගයට අයත් වේ. මුත්‍රා, මත් පැන්, කාණු වතුර යනාදිය මෙයට උදහරණ කිහිපයකි. මෙම ජලය ආගමික කටයුතු ඉටුකිරීමට හෝ වෙනත් ද්‍රව්‍ය පිරිසිදු කිරීමට උපයෝගී කරගත නොහැකිය.

ආගමික වතාවත් ඉටුකිරීමේදී පිරිසිදුකම වැදගත් ස්ථානයක් ගන්නා අතර, පිරිසිදු කිරීමේදී ජලය ප්‍රධාන තැනක් දරන බව ඔබ දනී. ඉබාදත් ඉටුකිරීම සඳහා මහා කිල්ලෙන්ද සුළු කිල්ලෙන්ද ඉවත් වීමට නම් පිළිවෙලින් නෑමත් වුළූඃ කිරීමත් අනිවාර්ය වේ. අල්කුර්ආනයේ පහත සඳහන් වැකි පවසන්නේද මෙයමයි.

"ඔබ කිල්ලෙන් සිටින්නේ නම් ස්නානය කරන තෙක් (සලාතයට නොයන්න)"

"ඔබ කිල්ලෙන් සිටින්නේ නම් (අත් පා පමණක් සේදීම ප්‍රමාණවත් නොවේ, සම්පූර්ණ ශරීරයම සෝදා) පිරිසිදු වන්න" (5 : 6)

"විශ්වාසවන්තයිනි, ඔබ සලාත් කිරීමට නැගිට යන කල්හි (ඊට පෙර) ඔබගේ මුහුණද වැළමිට දක්වා ඔබගේ දෑත්ද සෝදා ගන්න. (ජලය අතගා) ඔබගේ හිස මස්හු කරගන්න. ඔබගේ පාද බොලටය දක්වා ඔබගේ පාද ද" (සෝදා ගන්න) (5 : 6)

මේවා සියල්ලටම ෂර්ත්, ෆර්ල්, සුන්නත් වශේම මුබ්තිලාත් ද ඇති බවද ඒවා ඉටුකරන ආකාරයද කලින් පන්තිවලදී ඔබ ඉගෙන ගෙන ඇත.

අනිවාර්ය ස්නානය හා වුළූඃ ඉටු කිරීමට නොහැකි වන්නත් තයම්මුම් කිරීමට ආගමේ අවසරය ලබා දී තිබේ. ඉහත අවශ්‍යතා සඳහා ජලය නොලැබෙන විටද අසනීප හේතුකොට ගෙන ජලය භාවිතයට ගත නොහැකි විටද තමන් සතුව ඇති ජලය පානය කිරීමට පමණක් ප්‍රමාණවත්ව ඇති විටකදී ද අධික සීතල නිසාද තයම්මුම් මගින් තමන් පිරිසිදු කර ගෙන ඉබාදත් ඉටුකළ හැකිය. අල්කුර්ආන් වාක්‍යයද මෙයම පවසයි. "ඔබ ජලය නොලද හොත් පිරිසිදු පසින් (ඔබ අතගා එයින්) ඔබගේ මුහුණ ද දෑත් ද පිස දමා තයම්මුම් කර ගන්න" (5 : 6)

ජබීරත්

සිරුරේ අවයවවල තුවාල, කැඩුම් බිඳුම් සිදුවෙන විට ඒ සඳහා පැලැස්තරය, වෙළුම් දමනු ලැබේ. මෙය අරාබි බසින් "ජබීරත්" යනුවෙන් හැඳින්වේ. මෙවැනි අවස්ථාවල ෆර්ල් වූ ස්නානය හෝ වුළූඃ ඉටුකිරීමේදී එම අවයවවල ජලය නොවදින තත්ත්වයක් මතුවේ. මෙම අවස්ථාවේදී ආගමික වතාවත් ඉටුකිරීමට සමහර කොන්දේසි පවතී.

එම තුවාල ඇති සිරුරේ කොටසට ජබීරත් දැමීමට පෙර වුළූඃ කළ යුතුයි. එසේ නොමැති නම් සෑම සලාතයට පෙරම ජබිරතනය ගලවා වුළූඃ කළ යුතුවේ. එසේ ගැලවීමෙන් අනතුරක් සිදු වෙතැයි සලකනු ලබන්නේ නම් ජලයෙන් සේදිය හැකි අවයව සෝදමින් තුවාල වූ කොටස් සෝදන විට තයම්මුම් කර සලාත් ඉටුකළ හැකිය. ඉස්ලාම් පිරිසිදුකමට දී ඇති වැදගත්කම සලකා ඒවා සුරැක අපි අපගේ දෛනික ඉබාදත් සහ අනෙකුත් කටයුතු නිවැරැදිව හා ක්‍රමානුකූලව ඉටු කරමු.

අභ්‍යාස :

1. පහත සඳහන් දෑ විස්තර කරන්න.
    * අල්මාඋත් තහූර්
    * අල්මාඋත් තාහිර්
    * අල්මාඋන් නජීස්
    * ජබීරත්

2. "ඉස්ලාම් පිරිසිදුකමට ලබා දී ඇති ප්‍රමුඛස්ථානය" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.

අත්තහාරත් II

2.2.2 අපිරිසිදුකම (නජිස්)

ඉස්ලාම් පිරිසිදුකමට වැදගත්කමක් දක්වන ආගමකි. මුස්ලිම්වරයෙක් තම සිත ද කයද වස්ත්‍ර ද පරිසරය ද පිරිසිදුව තබා ගැනීම ඉස්ලාම් ප්‍රිය කරයි. පිරිසිදුකමේ වැදගත්කම ගැන අල්ලාහ් අල්කුර්ආනයේ "නියත වශයෙන්ම අල්ලාහ් පව් කමාව අයදින්නන්ව ප්‍රිය කරයි. පිරිසිදුවන්නයින්ව ද ප්‍රිය කරයි." (2222) මෙසේ පවසයි. එසේම නබි (සල්) තුමාගේ "පිරිසිදුකම දේව විශ්වාසයේ අඩකි." (මුස්ලිම්) නම් හදිස් ද මෙය තහවුරු කරයි. එමනිසා මුස්ලිම්වරයෙක් අභ්‍යන්තරව ද බාහිරව ද පිරිසිදුව සිටිය යුතු අතර එසේ සිටීම ඉබාදතයක් වශයෙන් සලකා එයට ආනිසංසද ප්‍රදනය කෙරේ. කිලිවලින් පිරිසිදුවීමේ ක්‍රම ගැන කලින් පන්තිවල ඉගෙන ගත් ඔබ නජිස්වලින් පිරිසිදු වීමේ ක්‍රම මෙම පාඩම තුළින් ඉගෙන ගනු ඇත.

නජිස් නම් අරාබි පදයේ තේරුම "අපිරිසිදුකම" වේ. ඉස්ලාම්හි නජිස් වශයෙන් නිර්ණය කරන ලද ඒවා හැර අනෙකුත් සියළුම දේවල් පිරිසිදු ඒවා වේ. පිරිසිදු කිරීමේ ක්‍රම පදනම් කොට ගෙන නජිස් වර්ග තුනකට බෙදේ. ඒවා නම්,

1. දැඩි නජිස් 2. මෘදු නජිස් 3. සාමාන්‍ය නජිස්

දැඩි නජිස්

මෙයට බල්ලා සහ ඌරා යන දෙවර්ගයෙන්ම උපන් සතුන් ද ඒ සමගම මොවුන්ගෙන් පිටවෙන ලේ, මල, මුත්‍රා කෙළ සහ දහදිය යනාදිය ද දැඩි නජිස් වශයෙන් සැලකේ.

මෙම වර්ගයේ නජිස් යමක තැවරුණේ නම් මුලින්ම එය එතැනින් ඉවත් කළ යුතුය. පසුව එම නජිසයේ පැහැය, සුවඳ සහ රස යනාදි තුනම බැහැර වන සේ ඉතා පිරිසිදු ජලයෙන් සේදිය යුතුය. එසේ සෝදන විට පහත සඳහන් පිළිවෙත් අනුගමනය කළ යුතුයි.

1. සත්වතාවක් ජලය වත්කොට සේදීම.
2. පිරිසිදු පස් ද්‍රාවණයක් උපයෝගී කොට එක්වතාවක් සේදීම.
3. ඉන් අනතුරුව ඉතා පිරිසිදු ජලයෙන සය වතාවක් සේදීම.

අධික ජලයෙන් පිරී පවතින ජලාශවල සෝදන විට පතුලේ ඇති පස තරමක් කලතා නජිස් තැවරුණු ද්‍රව්‍යය එම ජලයේ ගිල්වා ගත් පසු නැවතත් සය වතාවක් ඉතා පිරිසිදු ජලයේ ගිල්වා ඔබ මොබ ගෙන යා යුතුය.

නජිස්හි පැහැය, සුවඳ හා රස නොතිබුණ ද ඉහත ක්‍රමයට සේදීම අවශ්‍ය වේ. එසේ සෝදා අවසන් කළ පසු තවත් දෙවතාවක් සේදීම සුන්නත් වේ.

මෘදු නජිස්

ආහාර වශයෙන් මව්කිරි පමණක් ආහාරයට ගන්නා අවුරුදු දෙකකට අඩු වයසැති පිරිමි දරුවාගේ මුත්‍රා මෙම වර්ගයට අයත් වේ. මෙය සැහැල්ලු නජිස් ලෙසද හඳුන්වනු ලබයි.

මෙය පිරිසිදු කිරීමට, මුලින්ම මෙම නජිස් තැවුරුණු ස්ථානය මීරිකා හෝ වෙනත් ආකාරයෙන් ඉවත් කළ යුතුය. පසුව නජිස් තැවුරුණු ස්ථානයේ ඉතා පිරිසිදු ජලය ඉසිය යුතුය.

සාමාන්‍ය නජිස්

දැඩි සහ මෘදු නජිස්වලට අයත් ඒවා හැර අනෙකුත් සියළුම නජිස් මෙම වර්ගයට අයත් වේ. මල, මුත්‍ර, ලේ, සැරව, වමනය, මත්පැන් වර්ග, ශුක්‍ර තරලය, නින්දේදී මුවින් බේරෙන කෙළ, මව්කිරි හැර අනුභව කිරීමට අනුමත නොකළ සෙසු සත්වයින්ගේ කිරි, මියගිය සතුන්ගේ (මත්ස්‍යා, පළඟැටියා, මිනිසාහැර) ශරීර අවයව යනාදිය මෙම වර්ගයේ නජිසයට උදාහරණ කිහිපයකි. අනුභව කිරීමට අනුමත සතුන්ගෙන් වෙන්වු රෝම. පිහාටු, සිරුරේ කොටස් සහ මිනිස් සිරුරේ අවයව ආදිය නජිස් නොවේ.

මෙම වර්ගයේ නජිස් පිරිසිදු කිරීමට, මුලින්ම එය තැවුරුණු ස්ථානයේ ඉවත්කළ යුතුය. ඉන් අනතුරුව එම නජිසයේ පැහැය, සුවඳ, රස ආදි තුනම ඉවත් වන තුරු සේදිය යුතුය. සබන් හෝ සෝදන කුඩු උපයෝගි කිරීමෙන් පමණක් එම නජිසය ඉවත් කළ යුතුනම් ඒවා උපයෝගි කිරීම ද අවශ්‍ය කරුණකි. එසේ සේදීමෙන් පසුව පැහැය, සුවඳ ආදියෙන් යමක් රැඳි තිබුණ ද එය වරදක් නොවේ. මේවා දෙකම ඉතිරී වී තිබුණද නැතහොත් රස පමණක් ඉතිරි වී තිබුණ ද එම ද්‍රව්‍ය පිරිසිදු බව නොසැලකේ. මෙසේ සේදීමෙන් අනතුරුව තවත් දෙවරක් සේදීම සුන්නත් වේ.

සාමාන්‍යයෙන් නජිස් ද්‍රව්‍ය අතරින් බල්ලා හා ඌරා හැර අනෙකුත් සතුන්ගේ සම සහ මත්පැන් ආදිය හැර අනෙකුත් ඒවා පිරිසිදු කළ නොහැකිය. සතුන්ගේ සම හොඳට පදනම් කිරීම තුළින් ද, රා වලට යමක් මිශ්‍ර නොවී ස්වභාවයෙන්ම විනාකිරි බවට පත්වීමෙන් ද පිරිසිදු වේ.

ඒසේම දියර වශයෙන් පවතින විටක කිරි, ගිතෙල්, තේ යනාදියට තුළ නජිස් වැටුණේ නම් එය පිරිසිදු කළ නොහැකිය. එහෙත් කිරි හෝ ගිතෙල් මිදී කැටි ගැසී ඇති තත්ත්වයක නජිස් වැටුණහොත් එම නජිස් තැවුරුණු කොටස ඉවත් කිරීමෙන් අනෙකුත් කොටස පිරිසිදු ඒවා බව සැලකේ.

නජිස්වල වර්ග සහ එයින් පිරිසිදු වීමේ ක්‍රමය ද ඉගෙන ගත් අපි, අප ජීවිතයේ ද එම පිළිවෙත් අනුගමනය කිරීමට උත්සහා කරමු.

අභ්‍යාසය

1. නජිස්හි ප්‍රධාන වර්ග උදහරණ සමඟ වගුගත කරන්න.
2. නජිස් වර්ග පිරිසිදු කිරීමේ ක්‍රම කෙටියෙන් සඳහන් කරන්න.

2.3 සිෆතුස් සලාත්

අල්ලාහ් තමන් නමදින්නට මනුෂ්‍ය වර්ගයා සහ ජින් වර්ගයා මවා ඇති බව අල්කුර්ආනය පවසයි. මෙය ඔබ අල්ඉබාදත් නම් පාඩමේ ඉගෙන ගෙන ඇත. ඉබාදත් අතර මූලික හා වැදගත් වනුයේ අස් සලාත් නම් නැමදුමයි. ඉස්ලාමයේ පංච මහා වගකීම් අතරින් ප්‍රමුඛත්වය දරන්නේ පරලොවේදී මුලින්ම ප්‍රශ්න කරනු ලබන කරුණ වන්නේද අප ජීවිතයේ සියළුම අවස්ථාවන්හිදීම ඉටු කළ යුතු නැමදුමක් වන්නේද සලාතය යි. මේ පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයේ "සලාතය ඉටුකරන්න. නියත වශයෙන්ම සලාතය විශ්වාසවන්තයින් හට කාලය නියම කරන ලද වගකීමක්" බව පවසයි.

තවද සලාතයේ නොසැලකිලිමත්ව සිටින්නන් හෙළා දකින අල්කුර්ආනය එය සිත් බියෙන් ඉටු කරන අයට සුභ පණිවුඩයක් පවසා ඇති බව පහත දැක්වෙන අල්කුර්ආන් වැකි වලින් දැනගත හැකිය.

"එහෙයින් තම සලාත්වල නොසැලකිලිමත් වන්නන් හට විනාශය අත්වේ". (107 : 5, 6)

"නියත වශයෙන්ම විශ්වාසවන්තයින් ජයගත්හ. ඔවුහු තම සලාතයේ මහත් සිත් බියෙන් සිටින අය වෙති". (23 : 1, 2)

තවද, නබි (සල්) තුමා විසින් උගන්වන ලද ක්‍රමයට අනුව අප සලාතය ඉටුකළ යුතු යැයි පහත සඳහන් නබිවදන අවධාරණය කරයි. "මම නමදින විට, ඔබ මා දුටු ආකාරයෙන්ම (ඔබ) නමදින්න." (බුහාරි)

අපගේ සලාතය නබි (සල්) තුමා ඉගැන්වූ ආකාරයට අනුව ඉටුකරන විට පාපයෙන් හා අකුසල් වලින් අපි සුරක්ෂිත වෙමු. මෙය අල්කුර්ආනය "නියත වශයෙන්ම සලාතය නින්දිත සහ පිළිකුල් සහගත දේ වලින් වළක්වයි". (29 : 45) යනුවෙන් පවසයි.

සලාතය අනිවාර්ය වූ තත්ත්වයක දිනපතා පංච කාල සලාතය ඉටු කරන විට ඒවායේ ෂර්ත්, ෆර්ල් නියමිත ආකාරයට ඉටුකළ යුතුය. ඒවා අත්හැරේ නම් සලාතය අවලංගු වේ. තවද, සලාතයේ සුන්නත් සුරැකීමෙන් සම්පූර්ණ ආනිසංස ලබාගත හැකිය. මෙම පාඩමේදී සලාතය ඉටු කරන ආකාරය අපි හොඳින් දැනගෙන සලාතය සුරකිමු.

සලාතයේ ෂර්ත් සියල්ල සම්පූර්ණ වූ තත්ත්වයක සලාතය ඉටුකරන්නා නියමිත පිළිවෙළට සලාතය ඉටුකළ යුතුය. එම පිළිවෙළ අපි එකිනෙකට ඉගෙන ගනිමු.

කිබ්ලාවට මුහුණලා සිටගෙන සිටීම.

සලාතය ඉටුකිරීමට සිටින්න, මුලින්ම කිබ්ලාවේ දිසාවට මුහුණලා කෙළින් සිරුවෙන් සිටිය යුතුයි. පිරිමින් තම දෙපා අතර තරමක හිඩැසක් ඇර ද, ස්ත්‍රීන් තම දෙපා ළංකර ද තබාගත යුතුය.

නියියත් තැබීම

නියියත් යනු චේතනාවයි. එබැවින් කෙනෙක් තමා ඉටු කිරීමට නියමිත සලාතයේ නියියතය සිතේ අදිටන් කරගත යුතුය. එනම් "නිශ්චිත සලාතය නමිදිමි" යනුවෙන් නියියත් තැබීම ප්‍රමාණවත්ය.

නිය්‍යතය සවිස්තරව තැබීමට අවශ්‍ය නම්, නිශ්චිත සලාතයේ රකඅත්වල සංඛ්‍යාව 'අද' වශයෙන් උතුම් කඃබාවට මුහුණ ලා අල්ලාහ් වෙනුවෙන් තමදිම් යනුවෙන් ද ඉමාම්වරයෙකු නම් "ඉමාමත්" යනුවෙන් ද ඉමාම්ව අනුගමනය කරන්නෙකු නම් "මඃමූමත්" යනුවෙන් ද එකතු කළ හැකිය. පංචකාල සලාත්වල නිය්‍යතය අරාබි බසින් පහත දැක්වේ.

اُصَلِّىْ ←
فَرْضَ الصُّبْحِ رَكْعَتَيْنِ
فَرْضَ الظُّهْرِ اَرْبَعَ رَكَعَاتٍ
فَرْضَ الْعَصْرِ اَرْبَعَ رَكَعَاتٍ
فَرْضَ الْمَغْرِبِ ثَـلَاثَ رَكَعَاتٍ
فَرْضَ الْعِشَاءِ اَرْبَعَ رَكَعَاتٍ
} اَدَاءً مُسْتَقْبِـلاً اِلَى الْكَعْبَةِ الشَّرِيْفَةِ لِلّٰهِ تَعَالَى

තක්බීර් කියා දෑත් බැඳීම

තැබීමෙන් අනතුරුව ඇඟිලි ඈත් නොකර ද ළං නොකර ද සාමාන්‍යයෙන් දිග හැර දෑත් උරහිසට උඩින් කන්වලට කෙළින් ඔසවා "අල්ලාහු අක්බර්" යැයි කියා දකුණත වමතට උඩින් මැණික් කටුව මත තබා පපුව මත හෝ නාභියට උඩින් බැඳ ගත යුතුය.

පිරිමින් නම් වැලමිටි දෙ ඇකයෙන් ඈතට ද ස්ත්‍රීන් නම් දෙඇකයට ළංකරද තබාගත යුතුය. මෙම සමාරම්භක තක්බීරය "තක්බීර් තහ්රීමා" යනුවෙන් හැඳින්වේ.

දුආඋල් ඉෆ්තිතාහ් පාරායනය කිරීම

තක්බීර් බැඳීමෙන් අනතුරුව උසුරුවන සමාරම්භක දුආව 'දුආඋල් ඉෆ්තිතාහ්" යනුවෙන් පළමුවෙනි රකඅතයේ දී පමණක් සමාරම්භක තක්බීරය සමගම දුආඋල් ඉෆ්තිතාහ් පාරායනය කළ යුතුය. අප සුපුරුදු පරිදි උසුරුවන 'වජ්ජහ්තු' මෙයට උදහරණයකි. මේ හැර නබි (සල්) තුමා පාරායනය කළ වෙනත් දුආ ද තිබේ. මේවායින් යමක් පාරායනය කිරීමෙන් පසුව අලාදු බිල්ලාහ් ද උසුරුවිය හැකිය.

وَجَّهْتُ وَجْهِيَ لِلَّذِيْ فَطَرَ السَّمٰوَاتِ وَالْاَرْضَ حَنِيْفًا مُسْلِمًا وَمَا اَنَا مِنَ
الْمُشْرِكِيْنَ اِنَّ صَلَاتِي وَنُسُكِي وَمَحْيَايَ وَمَمَاتِي لِلّٰهِ رَبِّ الْعَالَمِيْنَ لَاشَرِيْكَ
لَهُ وَبِذٰلِكَ اُمِرْتُ وَاَنَا مِنَ الْمُسْلِمِيْنَ

සුරතුල් ෆාතිහාව පාරායනය කිරීම

දුආඋල් ඉෆ්තිතාහ් වලින් අනතුරුව බිස්මි සමග සුරතුල් ෆාතිහාව පාරායනය කළ යුතුයි. සෑම රකඅතයක්ම ආරම්භයේදී සුරතුල් ෆාතිහාව පාරායනය කළ යුතුයි. එසේ පාරායනය කිරීමෙන් පසුව "ආමීන්" යනුවෙන් කිව යුතුය. ප්‍රථම රකඅත් දෙකේදී පමණක් ෆාතිහාවෙන් පසු අල්කුර්ආනයේ වෙනත් සූරාවක් හෝ වැකි කිහිපයක් පාරායනය කළ යුතුයි.

රුකූඋ කිරීම

පසුව සමාරම්භක තක්බීරයේ දී මෙන් දෑත් ඔසවා තක්බීර් කියමින් රුකූඋවට යා යුතුය. රුකූඋහිදී දෑත්වල ඇඟිලි සියල්ල තරමක් විහිදුවා දෙ අත්ල දණහිස්වල තබා හිස, පිට ආදිය එකම මට්ටමක පිහිටන සේ තබා නැමී සිටිය යුතුය. මෙහිදී ද පිරිමින් තම අත් ඇකයෙන් ඈත් කරමින් ද ස්ත්‍රීන් ඇකයට ළං කරමින් ද තබාගත යුතුය. පසුව,

سُبْحَانَ رَبِّيَ الْعَظِيْمِ وَبِحَمْدِهِ

(තේරුම : මහිම වත්තයා වූ මාගේ පරමාධිපති විභූතිමත් කරමින් ප්‍රශංසා කරමි.)
යනුවෙන් තෙවරක් පාරායනය කළ යුතුය.

ඉඃතිදාලයට පැමිණීම

රුකූඋහි ස්වල්ප වේලාවක් රැඳී සිටීමෙන් අනතුරුව හිස ඔසවා සමාරම්භක තක්බීරයේදී මෙන් දෑත් ඔසවා سَمِعَ اللهُ لِمَنْ حَمِدَهُ

(තේරුම : තමන් ප්‍රශංසා කරන්නාට අල්ලාහ් සවන් දෙයි.)
යනුවෙන් කියමින් ඍජු ඉරියව්වට පැමිණිය යුතුය. ඉන් අනතුරුව පහත දැක්වෙන පරිදි උසුරුවිය යුතුය.

رَبَّنَا لَكَ الْحَمْدُ مِلْأَ السَّمٰوَاتِ وَمِلْأَ الْأَرْضِ وَمِلْأَ مَا شِئْتَ مِنْ شَيْءٍ بَعْدُ

(තේරුම : අප පරමාධිපතියාණෙනි, අහස් පිරුණු, පොළොව පිරුණු, ඉන් අනතුරුව ඔබ අභිමතය පරිදි සියල්ල පිරුණු ඔබටමය ප්‍රශංසා සියල්ල හිමි වනුයේ)

සුජුදු කිරීම

ඉඃතිදල්හි ස්වල්ප වේලාවක් රැඳී සිටීමෙන් පසුව දෑත් නො ඔසවා තක්බීර් කියමින් සුජූදයට ගොස් පා ඇඟිලිවල කෙළවරේ සුළු කොටසක්, දෙදණහිස්, දෙඅත්ල, නළල, නහය ආදී අවයව පොළොවට පතිත කර තැබිය යුතුය. අත්වල ඇඟිලි කිබ්ලාවට මුහුණලා දික්කරමින් දෙඅත්ල කන හෝ උරහිසට කෙළින් තබාගත යුතුය.

පිරිමින් වැලමිටි ඇකයෙන් ද, උදරය කලවාවලින් ද ඈත් කර තැබිය යුතුය. ස්ත්‍රීන් වැලමිටි ඇකයට ද උදරය කලවා සමඟද එකතු කර තැබිය යුතුය.

පසුව سُبْحَانَ رَبِّيَ الْأَعْلَى وَبِحَمْدِهِ

(තේරුම : අති ශ්‍රේෂ්ඨ වූ මාගේ පරමාධිපති විභූතිමත් කරමින් ප්‍රශංසා කරමි.)

යනුවෙන් තුන්වරක් උසුරුවිය යුතුය. මේ හැර වෙනත් දුආද අරාබි බසින් උසුරුවිය හැකිය.

මැද ඉඳුමට පැමිණීම

සුජූද්හි ස්වල්ප වේලාවක් රැඳී සිට දෑත් නොඔසවා තක්බීර් කියමින් හිස ඔසවා වම් පාදය මත වාඩිවී, ඇඟිලි කෙළවර කිබ්ලාවට මුහුණලා තිබෙන පරිදි දකුණු පාදය පොළොවෙහි සිරස්ව තැබිය යුතුයි. අත්වල ඇඟිලි කිබ්ලාවට මුහුණලා පිහිටන සේ තබා දෑත් දණහිසට කෙළින් කලවා මත තබාගත යුතුය. මෙය "ඉෆ්තිරාෂ්" ඉඳුම නමින් හැඳින්වේ. පසුව

رَبِّ اغْفِرْلِيْ وَارْحَمْنِي وَاجْبُرْنِي وَارْفَعْنِي وَارْزُقْنِي وَاهْدِنِي وَعَافِنِي

(තේරුම : පරමාධිපතියාණෙනි, මට කමාකොට දයාව පිරිනමන්න; මාගේ අඩුපාඩු සපුරන්න. මා උසස් කොට භාග්‍ය පිරිනමන්න; මා ඍජු මාර්ගයේ මෙහෙයවා මට සුවය සලසන්න.) යනුවෙන් උසුරුවිය යුතුය.

දෙවෙනි සුජුදයට යෑම.

මැද ඉඳුමෙහි ස්වල්ප වේලාවක් රැඳිමෙන් පසුව දැත් නොඔසවා තක්බීර් කියමින් දෙවන වර සුජුදයට යා යුතුය. මෙහිදී ද පළමු සුජුදයේදී මෙන් ස්වල්ප වේලාවක් රැඳී සිට එයට අදාල තස්බිහ් පාරායනය කළ යුතුය.

මෙසේ දෙවන සුජුදයේ ස්වල්ප වේලාවක් රැඳී සිට හිස ඔසවා අත් නොඔසවා තක්බීර් කියමින් ඉෆ්තිරාෂ් ක්‍රමයට ස්වල්ප වේලාවක් වාඩිවී ඉන් අනතුරුව නැවතත් නැගිට දෙවෙනි රකඅතයට යා යුතුය. එහිදී නැවතත් දෑත් බඳිමින් සුරතුල් ෆාතිහාව සමඟ සුපුරුදු පාරායනාවන් උසුරුවා සලාතය පවත්වා ගෙන යා යුතුය.

කුනුත් පාරායනය කිරීම.

සුබ්හු සලාතයේ දෙවන රකඅතයේදීත් රමළාන් මාසයේ අවසන් භාගයේදී විත්ර් සලාතයේ අන්තිම රකඅතයේදීත් ඉඃතිදාල්හිදී අදාල පාරායනාවන් උසුරුවා නිම කළ පසු දෙඅත්ල උරහිසට කෙළින් ඔසවා කුනුත් පාරායනය කිරීම සුන්නත් වේ.

අත්තහියියාත්

මෙහිදී පළමු අත්තහියියාත්, අවසාන අත්තහියියාත් යනුවෙන් ඉඳුම් දෙකක් ඇත. රකඅත් දෙකකට වැඩි (තුනක් හෝ හතරක්) රකඅත්වලින් යුක්ත සලාත්වල දෙවන රකඅතයේ දී දෙවනි සුජුදයෙන් පසුව 'ඉෆ්තිරාෂ්' ක්‍රමයට වාඩිවී අත්තහියියාත් පාරායනය කිරිම පළමු අත්තහියියාත් යනුවෙන් හැඳින්වේ.

اَلتَّحِيَّاتُ الْمُبَارَكَاتُ الصَّلَوَاتُ الطَّيِّبَاتُ لِلّٰهِ، اَلسَّلَامُ عَلَيْكَ أَيُّهَا النَّبِيُّ
وَرَحْمَةُ اللهِ وَبَرَكَاتُهُ، اَلسَّلَامُ عَلَيْنَا وَعَلَى عِبَادِ اللهِ الصَّالِحِيْنَ، أَشْهَدُ أَنْ
لَا اِلَهَ إِلاَّ اللهُ، وَأَشْهَدُ أَنَّ مُحَمَّداً رَسُوْلُ اللهِ. اَللّٰهُمَّ صَلِّ عَلَى مُحَمَّدٍ.

මෙහිදී අත්තහියියාත් පාරායනය කිරිමෙන් අනතුරුව තෙවන රකඅතය සඳහා නැගිටින විට දෑත් ඉදිරිපිට පොළොවේ තබා වාරුවෙන් නැගිට දෑත් සමාරම්භක තක්බීරයේ දි මෙන් ඉහළට ඔසවා බැඳගත යුතුය.

සලාතය අවසාන රකඅතයේදී දෙවනි සුජුදයෙන් පසුව අත්තහියියාත් පරායනය කිරීම සඳහා වාඩි වීම අවසාන අත්තහියියාත් යනුවෙන් හැඳින්වේ. මෙහිදී වම් පාදය දකුණු පාදයට යටින් යවා පොළොව මත වාඩිවිය යුතුය. දකුණු පාදය 'ඉෆ්තිරාෂ්' ඉඳුමෙහි තබාගත යුතුය. මෙය 'තවර්රුක්' ඉඳුම යනුවෙන් හැඳින්වේ.

අත්තහියියාත් ඉඳුම් දෙකේදීම වම් අතේ ඇඟිලි කිබ්ලාවට මුහුණලා දික්කරමින් වම් දණහිසට කෙළින් කලවා මත තබාගත යුතුය. දකුණතේ දබරඟිල්ල තරමක් ඇතුළට නමා එහි අග පහතට ගෙන මහපට ඇඟිල්ල සමඟ දකුණු දණහිසට කෙළින් කලවා මත තබා ගත යුතුය. දකුණතේ සෙසු ඇඟිලි තුනම සම්පූර්ණයෙන්ම ඇතුළට නමා තැබිය යුතුය.

අත්තහියියාත් හිදී "අෂ්හදු අන් ලාඉලාහ ඉල්ලල්ලාහ්" යනුවෙන් පරායනය කරන විට දකුණතේ දඹරඟිල්ල කිබ්ලාවට මුහුණලා මුළුමනින්ම දිගුකළ යුතුය. පළමු අත්තහියියාත් නම් තුන්වෙනි රකඅතයට නැගිටින තෙක් ද අවසාන අත්තහියියාත් නම් සලාම් කියන තෙක් ද දිගු කර එම දබරඟිල්ල බලාගෙන සිටිම ද අනෙකුත් ඉරියව්වල සුජුද් කරන ස්ථානය බලා සිටීමද ද සුන්නත් වේ.

අත්තහියියාත් සමඟ සලාවාත් පාරායනය කිරීමද අවශ්‍ය වේ. මෙයට අමතරව නබි (සල්) තුමා පාරායනය කළ දුආවන් පාරායනය කිරීමද යහපත්ය. තමන් කැමැති වෙනත් දුආවන්ද අරාබි බසින් පාරායනය කළ හැකිය.

اللَّهُمَّ صَلِّ عَلَى مُحَمَّدٍ وَعَلَى آلِ مُحَمَّدٍ، كَمَا صَلَّيْتَ عَلَى اِبْرَاهِيمَ
وَعَلَى آلِ اِبْرَاهِيمَ، إِنَّكَ حَمِيدٌ مَجِيدٌ، اللَّهُمَّ بَارِكْ عَلَى مُحَمَّدٍ وَعَلَى
آلِ مُحَمَّدٍ كَمَا بَارَكْتَ عَلَى اِبْرَاهِيمَ وَعَلَى آلِ اِبْرَاهِيمَ إِنَّكَ حَمِيدٌ
مَجِيدٌ. (صحيح البخار)

සලාම් කීම සහ ඉන් අනතුරුව පාරායනා

අවසාන අත්තහියාත් පාරායනය කිරීමෙන් අනතුරුව මුලින්ම දකුණු පැත්තට اَلسَّلَامُ عَلَيْكُمْ وَرَحْمَةُ اللهِ කියමින් හැරී බැලිය යුතුය. පසුව එසේම සලාම් කියමින් වම් පැත්තට හැරී බැලිය යුතුය.

සලාම් කීමත් සමඟම සලාතය නිම වේ. ඉන් අනතුරුව اَسْتَغْفِرُ اللهَ
(තේරුම : අල්ලාහ්ගෙන් කමාව අයදිමි)
යනුවෙන් තෙවරක් නිහඬව කිව යුතුය. මින් අනතුරුව පාරායනය කළ යුතු තස්බීහ් ද දික්ර් ද ඇත.

උදාහරණ : اَللّٰهُمَّ اَنْتَ السَّلَامُ وَمِنْكَ السَّلَامُ تَبَارَكْتَ يَاذَا الْجَلَالِ وَالْإِكْرَامِ

(තේරුම : යා අල්ලාහ්, ශාන්තිය ඔබමය ! ඔබගෙන්ම ශාන්තිය උදාවේ. මහිමය හා ගෞරවය ඇත්තාණෙනි ඔබ ශ්‍රේෂ්ඨ වුයෙහිය)

سُبْحَانَ اللهِ

(තේරුම : අල්ලාහ් පාරිශුද්ධ වන්තයාය)
(33 වරක්)

اَلْحَمْدُ لِلّٰهِ

(තේරුම : සියළු ප්‍රශංසා හිමිවනුයේ අල්ලාහ්ටය)
(33 වරක්)

اَللهُ اَكْبَرُ

(තේරුම : අල්ලාහ් ඉතා ශ්‍රේෂ්ඨවන්තයාය)
(34 වරක්)

සුබ්හු සහ මෘරිබ් සලාත් වලින් අනතුරුව කලිමතුත් තෞහිදය දස වතාවක් පාරායනය කිරීම සුන්නත් වේ.

දුආ

සලාතයෙන් පසුව අසනු ලබන දුආ පිළිගනු ලැබේ. එබැවින් අපගේ අවශ්‍යතා අල්ලාහ්ගෙන් ඇසීමට සලාතයෙන් පසු වේලාව හොඳ අවස්ථාවකි. අල්ලාහ්, ඉවසීම සහ සලාතය පිහිට කරගෙන උදව් පතන ලෙස අල්කුර්ආනයේ සඳහන් කරයි.

එමනිසා අපි සලාතයේ පිළිවෙත් මනාව ඉගෙන ගෙන, අපගේ සලාත් නිවැරදිව හා ක්‍රමානුකූලව ඉටුකර අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීමට උත්සහ කරමු.

අභ්‍යාසය

1. සලාතය ඉටුකිරීම පිළිබඳ අල්කුර්ආන් වැකිවලින් තුනක් තර්ජුමතුල් කුර්ආනයෙන් (අල්කුර්ආනයේ සිංහල අනුවාදයෙන්) තෝරා ලියන්න.
2. සලාතයේ ෆර්ල් හා සුන්නත් ගුරුවරයාගේ / ආලිම්වරයාගේ සහාය ඇතිව දැනගෙන වගුගත කරන්න.
3. පහත සඳහන් අරාබි වචනවල තේරුම ලියන්න.
   (අ) නියියත්
   (ආ) තක්බීර් තහ්රීමා
   (ඇ) දුආඋල් ඉෆ්තිතාහ්
   (ඈ) ඉඃතිදල්

2.4 අස්සව්ම්

ඉස්ලාම්හි පංච මහා වගකීම් අතරින් සිව්වන තැන උපවාසයට හිමිවන බව ඔබ කළින් ඉගෙන ගෙන ඇත. අරාබි බසින් අස්සවිම් යනුවෙන් මෙය හැඳින්වේ.

උපවාසය මුහම්මද් (සල්) තුමාගේ සමාජයට පමණක් නොව ඊට පෙර සමාජයේ අයට ද පවරා තිබිණි. අල්කුර්ආනය මෙය පහත වාක්‍යයෙන් පෙන්වා දෙයි.

විශ්වාසවන්තයෙනි, ඔබට පෙර සිටි (නබිවරුන් අනුගමනය කළ) අයට පවරා තිබූ ආකාරයටම ඔබටත් සවිමය පවරා ඇත. (2 : 183)

ඉහත වාක්‍යයට අනුව උපවාසය යනු ඉබාදතයක තත්ත්වයේ තිබීම අපට දැනගත හැකිය. එහෙත් උපවාසයේ පිළිවෙත්, එහි සංඛ්‍යාව, එය පවතින කාලය යනාදි කරුණුවල සෑම සමාජයක් අතරම වෙනස්කම් පැවැතියේය.

මෙම පාඩමේ දී සව්ම් පිළිබඳ විස්තර, පිළිවෙත් හා වර්ග ඉගෙන ගෙන නිසි ක්‍රමයට ඉටුකිරීමට උත්සාහ කරමු.

උපවාසය හඟවන "අස්සවම්" නම් අරාබි පදයේ ඍජු තේරුම වනුයේ වළක්වා ගැනීමයි. ඉස්ලාමීය ව්‍යවහාරයේ දී මුස්ලිම්වරයෙකු අළුයම සිට එදින හිරු බැස යන තෙක් ආහාර පාන සහ ලිංගික තෘප්තිය විඳීම යනාදි ක්‍රියාවලින් තමන් වළක්වා ගැනීමයි. සව්ම් කඩ කරන කිසිම කාර්යයක තමන් නියැලීමෙන් වළක්වා ගැනීම මෙයින් අදහස් කෙරේ. හිජ්රි දෙවනි වර්ෂයේ දී සව්ම් මුස්ලිම්වරුන්ට පවරන ලදී.

සව්මයේ ෂර්ත්

කෙනෙකුට සව්ම් අනිවාර්ය වීමට කොන්දේසි කිපයක් ඇත. අපි ඒවා සව්මයේ ෂර්ත් ලෙස හඳුන්වමු.
1. මුස්ලිම්වරයෙකු වීම.
2. වැඩි වියට පත්ව සිටීම.
3. හොඳ සිහියෙන් පසුවීම.
4. සව්ම් සමාදන් වීමට තරම් ශක්තියක් තිබීම.
5. මාසික ඔසප් (හෛළ්) සහ ප්‍රසව රුධිර වහනයෙන් (නිෆාස්) කාන්තාවන් මිදී සිටීම.

වැඩිවියට පත් නොවූ කුඩා ළමුන්ට සව්ම් අනිවාර්ය නොවන නමුත් ඔවුන් සත් වෙනි වියේ සිටම සලාතයට පුරුදු කරන ආකාරයට, ඔවුන්ගේ ශරීර සුවය සහ ශරීර ශක්තිය සැළකිල්ලට ගෙන පුහුණු කිරීම සඳහා සෑම වසරකම සමහර දවසකට සව්ම් සමාදන් වීමට ඉඩ හැර එම දින ගණන සෑම වසරකටම ටිකින් ටික වැඩි කළ හැකිය. නියමිත වයසට පැමිණෙන විට අමාරුවෙන් තොරව සව්ම් සමාදන් වීමේ පුහුණුවක් එම ළමයා මෙයින් ලබාගනී.

සව්මයේ ෆර්ල්

සව්මයේ ෂර්ත් සම්පූර්ණ වූ කෙනෙක් සව්ම් සමාදන් වීමේ දී අනිවාර්යයෙන්ම අනුගමනය කළයුතු කරුණු ෆර්ල් නමින් හැඳින්වේ.

1. නියියත් තැබීම :
නිශ්චිත ෆර්ල් වූ හෝ සුන්නත් වූ සව්මය අල්ලාහ් වෙනුවෙන් සමාදන් වන බව සිතින් චේතනාවක් ඇති කර ගැනීම නියියත් යනුවෙන් හැඳින්වේ.

2. අරුණෝදයේ සිට සැදෑයාමයේ හිරු සම්පූර්ණයෙන්ම බැස යන තුරු සව්ම් කඩවන කිසිම ක්‍රියාවක (මතක ඇතිව) නියැළී නොසිටීම.

සව්මයේ සුන්නත්

උපවාසයේ ෆර්ල් නිසියාකාරව ඉටුකිරීමෙන් සව්ම් ඉටුවන අතර සව්ම්දාරියෙකු අල්ලාහ්ගෙන් අමතර ආනිසංස ලබා ගැනීමට නම් සව්මයේ සුන්නත් ද දැන ඒවා ද ඉටුකළ යුතුය. ඒවායින් සමහරක් පහත දැක්වේ :

1. සහර්කිරීම : මැදියම් රැයෙන් පසුව යම් ආහාරයක් අනුභව කිරීම.

2. හිරු සම්පූර්ණයෙන්ම බැස යෑමෙන් අනතුරුව සව්ම් හැරීම, රට ඉඳි අනුභව කර සව්ම් හැරීම සුන්නත් වේ. එය නොමැති විටක වතුර පානය කිරීමෙන් ද සව්ම් හැරිය හැකිය.

3. සව්ම් හැරීමෙන් අනතුරුව දුආ ඉල්ලීම. තමන්ගේ අවශ්‍යතා ද මෙම අවස්ථාවේදී ඉල්ලා සිටිය හැකිය.

4. සව්ම්දාරින්ට සව්ම් හැරීමට සහායවීම.

5. අල්කුර්ආන්, දික්ර් වැඩි වශයෙන් පාරායනය කිරීම.

6. අල්ලාහ්ගෙන් වැඩි වශයෙන් දුආ කිරීම.

7. සදකා වැනි දන්දීම වැඩි වශයෙන් ඉටු කිරීම.

8. රමළාන් මාසයේ රාත්‍රිවල තරාවීහ්, කියාමුල් ලෛල්, විත්ර් වැනි සුන්නත් වූ රාත්‍රි නැමැදුම්වල නියැලීම.

9. මස්ජිද්වල අල්ලාහ් වෙුනවෙන් ඉඃතිකාෆ් සිටීම. රමළාන් මාසයේ අවසාන දින දහයේදී ඉඃතිකාෆ් සිටීම සුවිශේෂී වේ.

සව්මයේ මුබ්තිලාත්

සව්මය කඩ වන ක්‍රියාවන් මුබ්තිලාත් යනුවෙන් හැඳින්වේ, ඒවා නම්,

1. කට, නාසය, කන යනාදී සිරුරේ විවර තුළින් ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය වුවමනාවෙන්ම ඇතුළු කිරීම.
2. වැයමෙන් වමනය කිරීම.
3. පිස්සු වැනි සිහිවිකල් බවක් ඇතිවීම.
4. සව්ම් සමාදන්ව සිටියදී සිහිසුන් වීම.
5. ශුක්‍ර පිටකිරීම.
6. ලිංගික සංසර්ගය හෝ ලිංගික තෘප්තිය විඳීම.
7. රිද්දත් ඇතිවීම.
8. කාන්තාවන්ට මාසික ඔසප් (හෛළ්), ප්‍රසව හා රුධිර වහනය (නිෆාස්) ඇතිවීම.

ඉහත මුබ්තිලාත්වලින් යමක් අමතක වීමකින් හෝ නොදැනුවත්ව කිරීමෙන් හෝ ඉබේම වමනය ඇතිවීමෙන් හෝ නින්දේදී ශුක්‍ර පිටවීමෙන් සව්ම් කඩ නොවේ. ෆර්ල් වන සව්ම් සමාදන් වෙමින් ලිංගික සබඳතා පවත්වා සව්ම් කඩ කළ කෙනෙක් ඒ වෙනුවෙන් "කෆ්ෆාරා" නම් වරද සඳහා වූ ප්‍රතිකාරය කළ යුතුය. වහලෙකු නිදහස් කිරීමෙන් හෝ එය නොහැකි නම් දෙමසක් අඛණ්ඩව සව්ම් සමාදන්වීමෙන් හෝ එයටත් හැකියාවක් නොමැති නම් දුගී දුප්පතුන් හැට දෙනෙකුට ආහාර වේලක් සැපයීමෙන් හෝ මෙය ඉටුකළ හැකිය. වෙනත් හේතූන් නිසා සව්ම් කඩවේ නම් ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිය යුතු අතර හැකි ඉක්මනින් වෙනත් දිනයක එම සව්ම් කළා කළ යුතුය.

සව්ම් සමාදන් වීමෙන් නිදහස් වන්නන්

සෑම මුස්ලිම්වරයෙකුටම සව්ම් අනිවාර්ය කර තිබෙන නමුත් සමහරුන්ගේ ශාරීරික තත්ත්වය සැලකිල්ලට ගෙන සව්ම් සමාදන් වීමෙන් ඔවුන්ව නිදහස් කර ඇත.

1. සව්ම් සමාදන්වීමට ශක්තියක් නොමැති රෝගීන් හා මහළු වයස් ගතවූවන්.

සව්ම් සමාදන් විය නොහැකි තත්ත්වයේ නිදන්ගත රෝග වලින් පෙළෙන්නන්ද මහළු විය නිසා දුර්වල වී කුස ගින්න ඉවසිය නොහැකි වන අය ද රමළානයේ සෑම සව්ම් දිනයක් වෙනුවෙන්ම "ෆිද්යා" දිය යුතුය. එනම් සෑම සව්මයක්ම වෙනුවෙන් දිළින්දෙකුට ආහාර වේලක් සැපයිය යුතුය. සුව විය හැකි තාවකාලික ලෙඩින් පෙළෙන්නන් වෙනත් දිනයක සව්ම් එම සව්ම් සමාදන් විය යුතු අතර, (කළා කිරීම) ෆිද්යා ද පිරිනැමිය යුතුය.

2. ඉස්ලාම්හි අනුමත ගමනක යෙදී සිටින්නන්

මෙවැනි ගමනක යෙදී සිටින්නන් එදින සව්ම් සමාදන් නොවී වෙනත් දිනයක එය "කළා" කළ යුතු වේ.

3. ගැබ්ණියන් සහ කිරි දෙන මව්වරුන්

ඉහත දෙපාර්ශවයම සව්ම් සමාදන් වීම නිසා තමන්ට හෝ තම දරුවාට එය බලපාන බව බිය වන්නේ නම් සව්ම් සමාදන් නොවී සිටිය හැකි නමුත් එම බිය දුරුවෙන තත්ත්වයක් උදාවීමෙන් අනතුරුව එම සව්ම් කළා කළ යුතුය. තවද, සමාදන් නොවූ සව්මයක් වෙනුවෙන් දිළින්දෙකුට ආහාර වේලක් සැපයිය යුතුය.

තවද, මාසික ඔසප් (හෛළ්) ප්‍රසව රුධිර වහනය (නිෆාස්) ඇතිවූ ස්ත්‍රීන් ඉන් සුවවී පිරිසිදු වීමෙන් අනතුරුව සව්මය කළා කළ යුතුය.

සව්ම් සමාදන්වීමට තහනම් වන දින

පහත සඳහන් දිනවල සව්ම් සමාදන් වීම තහනම් කර ඇත.

1. ඊදුල් ෆිතර් නම් නෝම්බි උත්සව දින
2. ඊදුල් අල්හා නම් හජ් උත්සව දින
3. අය්යාමුත් තෂ්රීක් නම් දුල්හජ් 11, 12, 13 දින
4. සැකමුසු දිනයන් ෂඃබාන් මාසයේ අවසානයේදී රමළාන් මාසයේ හඳ දර්ශනය වුයේද? නැද්ද? යනුවෙන් තහවුරු කළ නොහැකි දවස.

<u>අභ්‍යාසය</u>

1. අස්සව්ම් යන්නෙහි තේරුම කුමක් ද?
2. අස්සව්ම් පිළිබඳව අල්කුර්ආනයේ සඳහන් වාක්‍ය වලින් තුනක් තර්ජුමතුල් කුර්ආනයෙන් (අල්කුර්ආනයේ සිංහල අනුවාදයෙන්) තෝරා ලියන්න.